# හෝ චි මිං ගෙන් පාඩමක්



පුවතර්පතක් වියත් නොවියත් සියලු දෙනා අතරම වෙනසක් නැතිව ගැවසීමට බලා බලාපොරොත්තු වේ. වියතුන් ගැන මම පමණක් සිතා පළ කෙරෙන පුවත් පත්වල ආයුෂ කෙටිය. නොවියතුන් සඳහාම පලකෙරෙන බොළඳ පුවත්පත් වලට ද ඇත්තේ අඩු ආයුෂකි. පොදු ජනතාව අතර සිටින යමක් කමක් දත් අයගේ ගැරහීමට බොළඳ පුවත්පත් ලක්වෙයි.

ඒ ගැරහීම් පොදු ජනතාව අතර සිටින වැඩි දෙනාගේ මත වෙනස් කරයි. ඒ පුවත්පත් වැටෙයි. මේ නිසා වියත් නොවියත් දෙපසම සතුටු කළ හැකි ශක්තියක්, පුවත්පත් විශේෂාංග රචකයාට තිබිය යුතුය.
වියට්නාම් ජනාධිපතිව සිටි හෝ චි මිං විප්ලවය මෙහෙයවන යුගයේ පුවත්පතක් පළ කළේය. ඒ පුවත්පත් සඳහා ලිපියක් ලියූ ලේඛකයෙක් ඔහු හමුවීමට ගියේය.
''මේ ලිපිය සහෝදරයගෙ පුවත්පත් සඳහා මා ලිව්වේ'' ඔහු කීය
හෝ චි මිං එය කියවා බලා ලේඛකයා ඇමතුවේය.
''සහෝදරයා මේ ලිපිය අරගෙන අර හන්දියට යන්න. එතැන පසු කොට යන අයට මෙය කියවන්නට දී ඔවුන් කියන දේ මොනවාදැයි මට කියන්න''
ලේඛකයා ලිපිය ගෙන හන්දියට ගියේ ය.
බරක් ඔසවා ගත් ගොවියකු එනු පෙනිණි.
''සහෝදරයා, මේ මා ලියූ ලිපියක්. මෙය කියවන්න''
ගොවියා බර බිම තබා ලිපිය අතට ගත්තේය.
ඔහු කියවූයේ මුල් වැකි දෙක තුන පමණි.
''මට ඉක්මනට යන්න ඕනෑ. සහෝදරයා මේක ගන්න''
ගොවියා ලිපිය ආපසු දෙමින් කීවේය.
මඳ වේලාවකට පසු කියතක් ගත් වඩුවෙක් එතැනින් යන්නට ගියේය.
''ඔහොම ඉන්න සහෝදරයා'' මා ලියූ ලිපියක්. මෙය කියවා බලන්න, ලේඛකයා කීවේය.
වඩුවාද කියවූයේ මුල් වැකි දෙක පමණි.
''මට වැඩ තියෙනවා සහෝදරයා. මේක ගන්න''
ලේඛකයා එතනින් ගිය තව කීප කීප දෙනකුටම ලිපිය පෙන්වූයේය ය ඔවුන් දැක්වූයේ ද ගොවියා සහ වඩුවා දැක්වූ ප්‍රතිචාරයමය.
ලේඛකයා දොම්නස්ට පත් ව හෝ චී මිං හමුවීමට පැමිණියේය.
''හත් අට දෙනෙකුට ම දුන්නා. කියවන්නේ මුල් වැකි දෙක තුන පමණයි''
''එහෙමද? අපේ පත්තරේ ලිපි පළ වන්නේ ජනතාවට කියවීම් සඳහායි. ජනතාව නොකියවන ලිපි පල කිරීමෙන් පලක් නැහැ. සහෝදරයා ඔය ලිපියේ ජනතා නොකියවන්නේ ඇයි? ඒ ගැන සිතා බලා යළි ලියන්න. ජනතාව ආසාවෙන් කියවනු ඇති සිතෙන තරමට හොඳට ලිපිය ලියැවුණු පසු ආපසු එන්න. නැවත නැවත ලිවීමෙන් ලිපිය හැඩගැසෙන බව මතක තබා ගන්න.
හෝ චි මිං ලේඛකයාට අවවාද කළේය.
සතියකට පසු ඔහු නැවත පැමිණ හෝ චී මිං හමු වූයේය. යලි සැකසූ ලිපිය ඔහුට පෙන්වූයේය.
එය මුල සිට අගට කියවා හෝ චී මිං සතුටට පත් වූයේ ය.
''දැන් මෙය පුවත්පතට ගැලපෙනවා. පොදු ජනතාවට ගැලපෙනවා. ඔබ කියන්නට යන කාරණය ඒ අයුරින් ම වටහාගැනීමට අකුරු දන්නා ඕනෑම අයකුට හැකිවේ යැයි මා සිතනවා. ඔබ ඔබේ මුල් ලිපිය මුළුමනින්ම වෙනස් කරලා. මේක කලේ කොහොමද?''
ලේඛකයා මඳ වේලාවක් නිහඬව සතුට භුක්ති විඳ පසුව පිළිතුරු දුන්නේ ය.
''මගේ ලිපිය මා බිරිඳට පෙන්නුවා. ඇය ඒ ලිපිය ගැන සතුටු වූයේ නැහැ. මාමට පෙන්නුවා. ඔහු කියවූයේ පළමු වන ඡේදය පමණයි. කියවීම්ට කම්මැලි බව කීවා. මා ඊලඟට කාමරයට වී දොර වසාගෙන කල්පනා කළා. ලිපිය ඉරා දැම්මා යලි ලියන්නට පටන් ගත්තා.''

අද්‍යතන කියන වචනය වෙනුවට ''අද'' කියා ලිව්වා.තවත් ඒ වගේ බර වචන වෙනස් කළා. බර නැති පුහු ඝෝෂාවක් නැති වචන යෙදුවා. ඉදිරිපත් කරන ආකාරය වෙනස් කළා මා කියන විදිහට නොවෙයි ගොවියෙකු කියන විදියට ප්‍රශ්නය විස්තර කළා. ඔය විදියට මුළු ලිපියම වෙනස් කොට බිරිඳට, මාමට පෙන්නුවා .
සමහර ඡේද ගැන ඔවුන් සතුටු වූයේ නැහැ. ඉස්සර මා ඔවුන්ට කන් දුන්නේ නැහැ. නමුත් මම එදා ඔවුන්ට කන් දී ඡේද වෙනස් කලා. යළි පෙන්නුවා. ඔවුන් සතුටු වුණා. අල්ලපු ගෙදර එඬේරෙක් ඉන්නවා..ඔහුටද පෙන්නුවා.ඔහු සතුටු වුණා.
''ඔබ ගොවීන්ගේ ප්‍රශ්න ගැන ලියනවා. මට ගොවීන් ගැන දුකයි. ඒ වගේම ගොවියාට හතුරුකම් කරන අය ගැන තරහක් ඇති වෙනවා. මේ ක්‍රමය වෙනස් කරන්න ඕන කියලා හිතෙනවා . සහෝදරයා එඬේරු ගැනත් ලියන්න. අපිටත් ප්‍රශ්න තියෙනවා'' ඔහු කීවේය.
''මට සතුටක් ඇති වුණා. ඒ ලිපිය මා යළි දෙවරක් ලීවා. ලියන්න ලියන්න ලිපියට වැටෙන එළිය මට පෙනුණා. මට සතුට දරාගන්න බැරිවුණා. මා එයත් අරගෙන ඔය සහෝදරයා බලන්න ආවා''
ලේඛකයාගේ දෑස කඳුලු පිරී තිබිණි. සතුටු කඳුළු! හෝ චි මිං මෙසේ කීය.

''ලිවීමට පෙර අප ලියන්නේ කාට දැයි සිතන්න. මේ කියන දේ, සහ ලියන ආකාරය ඔවුන්ගේ හදවත් ස්පර්ශ කිරීම්ට සමත් වේදැයි සිතන්න.ලියූ දෙය දෙස තමා ම විචාරකයකු වී බලන්න. අසල්වැසියාට ද පෙන්වා ඔවුන්ගේ ප්‍රතිචාරය කුමක්දැයි සොයන්න. ඔබ මුලින් කළේ තමා ගේ අදහස කඩදාසියකට එකතු කිරීම පමණයි.,ඒවා වචන, වැකි ජනතාවගේ සිත් ස්පර්ශ කරන වාදැයි බැලීමට ඔබට පුළුවන් වූයේ නැහැ.''
ඇත්තටම ඔබට වුවමනා වූයේ ඔබේ ලිපිය ඉක්මනටම පුවත්පතේ පළ වෙනවා දකින්නයි. මතක තබාගන්න. පුවත්පතකට ලිපියක් යවන ලේඛකයා සැරසෙන්නේ අතිවි අතිවිශාල ජනකායක් ඇමතීමට බව. ලිපිය නිසරු නම්, ආකර්ෂණයෙන් තොර නම්, ජනතාව අහක බලාගන්නා බව මතකතබා ගන්න. ජනතාව අහක බලා ගන්නවා නම් ඒ ජනතාව ඇමතීමට වේදිකාවට නගින්නේ ඇයි? ජනතාව ආකර්ෂණයය කරගත හැකි අය පමණයි වේදිකාවට නැගීය යුත්තේ. ඒ හැකියාව ලබා ගන්නා තුරු වේදිකාවට නගින්න එපා. සහෝදරයා ඔබ දැන් ඒ ආකර්ෂණය ලබා ගැනීම්ට සමතකු වී ඇති බව පෙනෙනවා. දිගටම තමා අමතන්නේ කාටද යැයි සිතා ලියන්න. පුවත්පත් අති විශාල ජනකායකට සම්බන්ධ වේදිකාවක් බව අමතක කරන්න එපා''

# මෙල්බර්න් මහා බක්මහ සැණකෙළිය 2019



අලුත් අවුරුදු උදාව ශ්‍රී ලංකාවාසී අප සැමටම පොදුවූ විශේෂ උත්සවයකි. අතීතයේ සිටම පැවත එන අපටම ආවේනිකවූ විශේෂ සිරිත් විරිත් සමග මුසුවූ සමගිය,සමාදානය, එකමුතුකම පිළිබිඹු කරන්නාවූ කාල පරච්ඡේදයකි.

අවුරුදු දිනයදා, පවුලේ සියලුම දෙනා මහ ගෙදරට එකතුවී ශුභ මොහොතින් වැඩිහිටි ආශිර්වාදය ලැබ, එකට සිට කා බී ප්‍රීතිවී අපටම ආවේනිකවූ, අපේම සම්ප්‍රදායක ක්‍රීඩාවල යෙදෙමින් විනෝදයෙන් දවස ගෙවා දැමීම එදා සිටම සිරිතක්ව පවතියි.

විදේශ රටක කාර්යය බහුල ජීවන රටාවක් ගෙවන අපට, එවන් පසුබිමක් මෙහි නොමැති වුවද,හැකිතාක් දුරට එවන් දිනයක් නිර්මාණය කරදීමට දරණ උත්සාහයකි මෙල්බර්න් මහා බක් මහ උළෙල. සාමය, සමගිය, එකමුතුව මුල් කරගෙන අපගේ පැරණි ජන ක්‍රීඩා වලට මුල් තැන දෙමින්, මෙහි වෙසෙන අපගේ දරු දැරියන්ට විනෝදයෙන් දවස ගෙවා දැමීමට ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමය 26 වන වරටත් සංවිධානය කරනු ලබන මෙල්බන් මහා බක් මහ සැණකෙළිය වන සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය, මෙවරද අප්‍රියෙල් මස 07 වන ඉරු දින ඉතා උත්සවාකාරයෙන් සුපුරුදු පරිදි අපගේ මහ ගෙදර ලෙස ඩැංඩිනොන් ප්‍රදර්ශන භූමියේදි පැවත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත. ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත්වන වැඩිම ශ්‍රීලාංකිකයන් පිරිසක් වෙසෙන මෙල්බර්න් පුරවරයට අවුරුදු අසිරිය ගෙනෙන මෙම උත්සවය සඳහා ඕස්ට්‍රේලියාවේ, හා ශ්‍රී ලංකාවේ රාජ්‍යනියෝජිතයන් මෙන්ම අපගේ මාතෘ භූමියේ වෙසෙන සියලුම ජාතීන්ගේ නියොජිතයන්ද පැමිනීමට නියමිතය.

කාලයට ගැළපෙනසේ, අපේ දරු දැරියන් උදෙසා නවතම සැණකෙළි අංගයන්ද,විවිද නර්තන කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන නර්තනයන්ද ඇතුලත්ව,සන්ධ්‍යා සමය, ශ්‍රී ලංකාවේ ප්‍රකට සංගීත කණ්ඩායමක් වන සන් ප්ලවර් සංගීත කණ්ඩායමේ

මියුරු සංගීතයෙන් ඔබව පිනවීමට අමතරව, පසුගිය වසර වලදී මෙන් මෙවරද අලංකාර මල් වෙඩි සංදර්ශනයකින් උත්සවය නිමා කරන්නට සියලු කටයුතු පිළියෙළ වෙමින් ඇති බව සතුටින් දන්වා සිටිමු.

අපගේ ව්යාපාරිකයන් හට අත දීමක් වශයෙන්,
මෙරට සිටින හා ශ්‍රී ලංකාවේ සිට පැමිනෙන ව්‍යාපාරිකයන් හට ඔවුන්ගේ වෙළඳ භාණ්ඩ හා සේවාවන් ප්‍රදර්ශනය කිරීමට වෙළද කුටි ලබා දීමටද සංවිධායකන් අවස්තාව ලබාදී ඇත.

සියළුම සිංහල රස කැවිලි සමග ප්‍රනීත උදෑසන තේ මේසය මෙන්ම පහසු මිළට ඉතා රසවත් දිවා ආහාරයද ලබා ගත හැකි අතර පසුගිය වසර වලදී මෙන්ම විශේෂ අවස්තාවක් ලෙස මෙවරද සිව් වන වරටත් ප්‍රදානය කරනු ලබන නවතම මෝටර් රථයක් දිනා ගැනීම සඳහා අවුරුදු ලොතරැයියද පිලියෙළ වෙමින් පවතී.

අවුරුද්දකට එක් වරක් පමණක් එලැඹෙන මෙම විශේෂිත දිනයේ, දරු මුණුබුරු සියල්ලන් සමග සතුටින්, සාමයෙන් විනෝදවී, අපේ කම මතු පරපුරට අවබෝද කර දීමට පැමිණ සහභාගි වන ලෙස මෙල්බර්න්හි ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමය ඉතා කරුණා වෙන් ආරාධනා කර සිටියි.

Sherley Amarasinghe
ශ්‍රී. ලං.ජ .කා.ආ.සංගමය

